

# සමාජ අසාධාරණය ගීයෙන් කී විමුක්ති ගී

## විප්ලවවාදියකුගේ සැබෑ කතාව

සැබෑ මිනිසකු කියන සත්‍ය කතාව
අසා ලියන්නේ
**ජගත් ජේ එදිරිසිංහ**

4




නව යව්වනයේ සිටි අපි වේගවත් හා ජවසම්පන්න ගමණක නිරතව සිටියෙමු. වයස අවුරුදු 16 දී පක්ෂයේ සාමාජිකයකු වූ මම පසුව පූර්ණකාලිකයකු වන තෙක් මා ආ ගමනේ පා සටහන් අද මා තුළ ඇති කරන්නේ එක්තරා ආකාරයක සොම්නසකි. මා ජීවත් වූ සමාජයට යම් සේවයක් කරන්නට මම මගේ ජීවිතය කැප කළෙමියි යන සිතුවිල්ල මගේ සිතට සහනයක් ගෙනඑයි.

අපි පක්ෂය තුළ කළ විවිධ කාර්යයන් අතර විමුක්ති ගී ප්‍රසංගය සංවිධානය කිරීම මට අමතක නොවයි.

පක්ෂයේ මතවාදය පොදු ජනතාව අතරට ගෙන යාමේ රළු ක්‍රම වෙනුවට කලාව යොදා ගැනීම පක්ෂය අත්හදා බලමින් සිටියේය. විමුක්ති ගී එයට හොඳම උදාහරණයකි. විවිධ කලා සංවිධාන හරහා පක්ෂ සාමාජිකයන් නොවන නමුත් පක්ෂයට යම් හිතවත්කමක් තිබූ පිරිස් පක්ෂය වටා එක් රැස් කර ගැනීමද එක් අපේක්ෂාවක් විය.

විමුක්ති ගී ඇරඹෙන්නේ 71 කැරැල්ලෙන් පසු පක්ෂයේ සාමාජිකයන් සිරගතව සිටි අවධියේය. නන්නද මාරසිංහ ප්‍රමුඛ පිරිසක් අතින් සිර ගෙදරදී විමුක්ති ගී නිර්මාණය වෙමින් තිබුණි. (පසු කලෙක පක්ෂයෙන් ඉවත්ව ගිය මාරසිංහ සහෝදරයා පක්ෂයේ සාමාජිකයකු අතින්ම ඝාතනය වීම අදත් මගේ සිත කම්පනයට පත් කරයි.)
පසු කලෙක සිරෙන් නිදහස්ව ආ මේ පිරිස විමුක්ති ගී සියල්ල එක්ක කර ප්‍රසංගයක් ලෙස සංවිධානය කරන්නට සමත් වූහ. සමහර විමුක්ති ගී නිර්මාණය සඳහා ප්‍රේමසිරි කේමදාස, ගුණදාස කපුගේ වැනි සංගීතඥයන්ගේ සහය ද ලැබී තිබුණි. ඉන්පසු ලයනල් බෝපගේ සහෝදරයාද විමුක්ති ගී වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළ බව මම දනිමි.

"ආගිරි ගගා පෙත්තා කරකැවෙන්නේ
දඩුවැට හතර පැත්තෙන් තනි රකින්නේ
අහසින් වැහි පොදක් නැහැ තව වැටෙන්නේ
කවදද සරු සාර යායක් කොටන්නේ"

"ජීවිතේ දුකකැයි කියා
හැර යා හැකිද
වැටී නොඉඳ
ජය ගනු මිසක"

"උතුරු කොනේ නුඹ හිනැහේ සිවරාජා මල්ලියේ
දකුණු කොණේ නුඹ හිනැහේ තිලකසිරි මල්ලියේ
උතුරු කොනේ නුඹ හිනැහේ තංගම්මා නංගියේ
දකුණු කොණේ නුඹ හිනැහේ සිරියලතා නංගියේ"

"කඳුයාය මත වැතිරී තේ නිල්ල හිමිදිරියේ
පිණි කඳුළු සළන්නේ වේදනා ගැන වේදනා-
වෙන්දෝ"

මේ යුගයේ දී පක්ෂය ජනවාර්ගික සමගිය උදෙසා දැඩි ලෙස පෙනී සිටි අතර උතුරු කොනේ කඳුයාය මත වැති රී වැනි ගීත දෙමළ භාෂාවෙන්ද ගායනා කිරීම විශේෂත්වයක් විය.

විමුක්ති ප්‍රසංගයේ ගී ගැයුවේ පක්ෂ සාමාජිකයටන් වූ තරුණ තරුණියන් පමණක් නොවේ. කතෝලික කන්‍යා සහෝදරියකද විමුක්ති ගී ප්‍රසංගයට එක් ව සිටියේ ඇගේ කන්‍යාරාමයට හොර රහසේ ය. පසු කළෙක ලයනල් බෝපගේ සහෝදරයාගේ බිරිඳ බවට පත්වන්නේ ඇය යි.

මුල් යුගයේ දී සුනිලා අබේසෙ-
'කර ද විමුක්ති ගී ගැයීමට එක්ව සිටියා ය. ප්‍රසංගයේ වේදිකාවෙන් පිටුපස නොයෙකුත් වැඩ කටයුතු වල නිරතව සිටි මට මුල සිටම ඇය පෙනුණේ අනෙක් අයට වඩා කැපී පෙනෙන ලෙසටය. ඇය කැපී පෙනනෙන්ට උත්සාහ කළා යයි මම නොකියමි. නමුත් ඉතාම විශිෂ්ට ලෙස ඉංග්‍රීසි කතා කරන ඇය ඇගේ සමාජ වටපිටාව නිසා අනෙක් සහෝදරියන් අතරින් කැපී පෙනෙන්නට ඇතැයි මම සිතමි. පසු කළෙක පක්ෂයේ නායකයකු වූ කෙලී සේනානායක සමගින් ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගත් පසු ඇය විමුක්ති ගී ප්‍රසංගයෙන් සහ පක්ෂයෙන් ඉවත්ව ගියාය. ඇය සමගින්ම කෙලී සේනානායකට සහෝදරයාටද පක්ෂයෙන් ඉවත් වන්නට සිදුවිය. පසු කළෙක් කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිමින් කැපී පෙනෙන සමාජ ක්‍රියාකාරිණියක බවට පත්ව සිටි සුනිලා වසර කීපයකට පෙර මෙළොවින් සමුගන්නා තෙක්ම විවිධ සමාජ ක්‍රියාකාරකම් වල නිරතව සිටියාය.

මට මතක හැටියට බොහෝ අවස්ථා වල විමුක්ති ගී ප්‍රසංගයේ නිවේදන කටයුතු කළේ දැන් ජනප්‍රිය රංග ශිල්පියකු වන බුද්ධදාස විතානච්චි සහෝදරයාය. ඉතා ප්‍රසන්න ගැඹුරු හඬකින් නිවේදන කටයුතු කළ ඔහු එවකට ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවය කළ බව මගේ මතකයයි. පසු කළෙක කොළඹ දිස්ත්‍රික්කයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයකු ලෙස කොළඹ සංවර්ධන සභාවටද ඔහු තේරී පත් විය. (සංවර්ධන සභා ඡන්දය පිළිබඳව ඉදිරියේ දී වෙනම ලියන්නට අදහස් කරමි)

පක්ෂයට ආදායම් ලබා ගැනීමේ එක් මාර්ගයක් වී තිබුණේ විමුක්ති ගී ප්‍රසංගයයි. දිවයිනේ විවිධ පළාත් වල පෙන්වූ විමුක්ති ගී ප්‍රසංග වලින් එක් වූ මුදලින් (අප දැන සිටියේ එසේය) බස් රථයක් මිලට ගන්නට පක්ෂය සමත් වී තිබුණි. ප්‍රසංගයේ සංගීත භාණ්ඩ ඇතුළු කළමනා දිවයිනේ එක් එක් පළාත් වලට ප්‍රවාහණය කෙරුණේ මේ බස් රථයෙනි. පක්ෂය කුළියට ගෙන තිබුණ කිරුළපන ප්‍රදේශයේ කුඩා නිවසක මේ භාණ්ඩ ගබඩා කොට තිබුණ බවත් ඒ වැඩ කටයුතු බාරව සිටියේ ජයතිලක නම් වන සහෝදරයෙකි. කුඩා සිරුරක් හිමි මේ ප්‍රසන්න තරුණයා ඉතා උද්‍යොගිමත් ලෙස ප්‍රසංගයේ සංවිධාන කටයුතු කළේය.

විමුක්ති ගී ප්‍රසංගයට සමාන්තරව පාසල් වයසේ සිසුන් ගේ දක්ෂතා ඔප් නංවනු වස් පාසල් සිසුන්ගෙන් සමන්විත ප්‍රසංගයක් සංවිධානය කිරීමේ අදහසක් පක්ෂට තිබූ නමුත් ඒ අදස ක්‍රියාත්මක කරන්නට පෙර පක්ෂය කහනමට ලක්විය.

විමුක්ති ගී හරහා ගායනයේ සමත් කම් පෑ සහෝදර සහෝදරියන් රැසක් බිහිවිය. අද මේ අය අතරින් කී දෙනෙකු ජීවත්ව සිටින්නේද යන්න දන්නා කෙනකු නැත. ඒ සුන්දර මිනිසුන් පිළිබඳ මතකය පමණක් අපේ සිත්වල ජීවත්වෙයි.

මතු සම්බන්ධයි

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com